**ලංකා පොස්පේට් සමාගම - 2021/2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ලංකා පොස්පේට් සමාගමේ ("සමාගම") 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු.47,738,672ක් වූ මුළු ණයගැති ශේෂය තුල වර්ෂ 3කට වැඩි රු.1,374,567ක හා වර්ෂ 6කට වැඩි රු.6,465,257ක අයකර නොගත් ණය ශේෂයන් පැවති අතර 2005 වර්ෂයේ සිට පැවත එන හඳුනා නොගත් රු.2,475,958ක ණයගැති ශේෂයන්ද පැවතිණි. | **වාරියපොල -** ණයගැතියන් දෙදෙනෙකු මාසිකව ගෙවීම් කිරීමට එකඟ වී ඇත. බොල් හා අඩමාන ණය වෙන් කිරීම් දැනටමත් සිදු කොට ඇත. **එප්පාවල -** රු.මි.8.9 ක ශේෂය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන, නිවැරදි කිරීම් සිදු කිරීමට කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දී ඇතත් අධ්‍යක්ෂ මණ්ඩල මගින් මේ සම්බන්ධයෙන් නිසි උපදෙස් ලබා දී නොමැති හෙයින් තවමත් මෙම ශේෂයන් ගිණුම්වල නිවැරදි කර ගැනීමට නොහැකි වී ඇත. | දීර්ඝ කාලයක සිට පවතින ශේෂයන් නිරවුල් කිරීමට හා අදාළ ණයගැති ශේෂයන් අයකර ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයන් ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 157,030,089ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු. 150,582,469 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,447,621 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ස්ථාවර තැන්පතු පොළී ආදායම් හා විවිධ ආදායම් පිළිවෙළින් රු. 4,931,136 ක් හා 2,896,449 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා පොස්පේට් සමාගම විසින් ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය යටතේ 2022 වර්ෂය සඳහා පොහොර ඇසුරුම් මළු 1,200,000 මිලදී ගැනීමට පලකළ LPL/SUP-HO/FI-BID/2022/05 ටෙන්ඩර් දැන්වීමට ආයතන 04ක් අයදුම් කර තිබුණි. එහිදී දෙවන වැඩි මිල ඉදිරිපත්කර තිබූ Lanka Polysacks (Pvt) Ltd ආයතනය වෙත 2022 පෙබරවාරි 28 දින රු.86 බැගින් පොහොර මළු 1,200,000ක් රු103,200,000කට ලබාදීමට පොස්පේට් සමාගම විසින් කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ලිපිය ලබා දී තිබුණි. එසේ වුවද 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කළ පසු විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කර නොතිබුණු අතර 5.4.10 වගන්තිය | මේ පිළිබඳ විස්තරාත්මක පිළිතුරක් විගණන විමසුමේ පිළිතුරු සමඟ යොමු කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව හා ආයතනයට උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි කටයුතු කළ යුතුය. |

ප්‍රකාරව වගකීම් පිළිබඳ බැඳීම් ආවරණය කර ගැනීමට කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. එසේ නොකිරීම නිසා ඇසුරුම් මළු 26,400ක ප්‍රමාණයක් රු.86 බැගින් ලබා දී ඉන් පසු ඇසුරුම් මල්ලක මිල රු. 120 දක්වා වැඩිකර තිබුණි. එම මිලට ඇසුරුම් මළු මිලදී ගැනීමට කැබිනට් අනුමැතිය ලබාගත යුතු බව අමාත්‍යාංශ ලේකම්තුමා විසින් දන්වා තිබුණද සමාගම විසින් කැබිනට් අනුමැතියක් ලබා නොගෙන රු.120 මිලට මළු 97,900ක ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

ඇසුරුම් මළු 1,200,000 මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදනයේ පවතින ලද ගැටළු හේතුවෙන් , ටෙන්ඩරය අහෝසි කර පොහොර ඇසුරුම් මළු 300,000ක් සඳහා ආයතන 09ක් වෙත විද්‍යුත් තැපැල මඟින් සීමිත ලංසු කැඳවීමක් (LPL/SUP-HO/FI-LQ2022/07) කර තිබුණි. මෙහිදී Lanka Polysacks (Pvt) Ltd පමණක් ලංසු ඉදිරිපත් කිරීම නිසා 2022 මැයි 09 දින එකක් රු.137.20 බැගින් පොහොර මළු 300,000 ක් (රු.41,160,000) මිලදී ගැනීමට ප්‍රතිග්‍රහණ ලිපියක් ලබා දී තිබුණ ද, 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 හා 8.9.1 වගන්තිය ප්‍රකාරව පිළිවෙලින් කාර්යසාධන සුරක්ෂණයක් හා ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණි. මෙහිදී ඇසුරුම් මළු 100,000 ක් පමණක් රු.137.20 බැගින් ලබාදී තිබුණද, ඇසුරුම් මල්ලක මිල වැඩිකර මළු 200,000 ක ප්‍රමාණයක් රු. 147.28 බැගින් ලබාදී තිබුණි.

මේ අනුව පොහොර ඇසුරුම් මළු 1,200,000 මිලදී ගැනීමට සිදුකළ LPL/SUP-HO/FI-BID/2022/05 ටෙන්ඩරය සඳහා බැගයක් රු.86 බැගින් මිලදී ගැනීමට 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව ලිඛිත ගිවිසුමකට හා 5.4.10 වගන්තිය ප්‍රකාරව කාර්යසාධන සුරක්ෂණයක් ලබා නොතිබීම නිසා ඇසුරුම් මළු 424,300ක් මිලදී ගැනීමට රු.36,489,800ක් ගෙවීම වෙනුවට විවිධ මිල ගණන් යටතේ රු.57,194,400ක් ගෙවීමෙන් සමගමට රු.20,704,600ක පාඩුවක් වී තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී රු.43,435,115ක් වැයකර මිලදීගත් 6 Roller (TGM 160) නව මිල් යන්ත්‍රය 2021 අගෝස්තු වන විටත් ස්ථාපනය කිරීම හෝ නිෂ්පාදනයට දායක කර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණු අතර, 2021 සැප්තැම්බර් මාසයේදී | රු.7,440,000ක ගෙවීම තුල යන්ත්‍රය ස්ථාපිත කිරීමේදි යොදාගත් කොටස් සඳහා වටිනාකම රු.3,990,000ක් වේ. | යන්ත්‍ර කොටස් ස්ථාපිත කිරීමට ඇති හැකියාව පිළිබඳ සැලකිලිමත්ව |

| | | | |
|---|---|---|---|
| | සවිකිරීම ආරම්භ කර 2022 සැප්තැම්බර් වන විට නිෂ්පාදනයට දායක කර ගැනීමට පරීක්ෂණ මට්ටමේ පැවතිණි. 2022 මාර්තු 31 වන විට මේ වෙනුවෙන් රු.37,366,525 ක වැයක් දරා තිබූ අතර, එම වියදමෙහි ඇතුලත් යන්ත්‍රය සවිකිරීම් ලෙස දක්වා තිබූ රු.7,440,000ක වියදමට අදාලව කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සිදු වී නොතිබුණි. එම වියදම සම්බන්ධයෙන් විගණනයට නිශ්චිත අනාවරණයක්ද සිදු නොවුණි.<br>එසේම 2022 මාර්තු 31 දිනට එප්පාවල ගබඩාවේ TGM 160 යන්ත්‍ර සඳහා මිලදී ගත් රු.43,474,868ක අමතර කොටස් පැවති අතර, මෙම කොටස් නව යන්ත්‍රය සකස් කිරීම සඳහා යොදා නොගත්තේ මන්දැයි විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය. මෙම යන්ත්‍රය සඳහා රු. 11,537,876 ක් වටිනා අමතර කොටස් සමාලෝචිත වර්ෂයේ දී අළුතෙන් මිලදී ගෙන තිබුණි. | රු.43,474,868 ක අමතර කොටස් වලින් කොටසක් පමණක් නව මිල් යන්ත්‍රය ස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වන අමතර කොටස වන අතර ඉතිරි සියළු කොටස් පැරණි TGM 160 යන්ත්‍රය සඳහා මිළදී ගත් අමතර කොටස් වේ. තවද මේ වන විටත් නව මිල් යන්ත්‍රය සඳහා අමතර කොටස් අප සතුව නොමැති අතර ආනයනය කිරීමට කටයුතු කරමින් සිටි. | කටයුතු නොකර යන්ත්‍ර කොටස් මිලදී ගැනීමට කටයුතු කර ඇති නිලධාරින්ට එරෙහිව ක්‍රියාකළ යුතුය. |
| (ආ) | 2014 පෙබරවාරි 14 දින රු.21,226,633ක ප්‍රාග්ධන වියදමක් දරමින් වාරියපොල පොල් පොහොර ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණු අතර පොල් පොහොර නිෂ්පාදනයට අමතරව 2021 පෙබරවාරි මස සිට රබර් වගාව සඳහා ද 12.14.14 සහ 15.15.07 යන පොහොර වර්ග නිෂ්පාදනය මෙහි ආරම්භ කර තිබුණි. රජය විසින් කාබනික පොහොර වගාවන් ප්‍රචලිත කිරීම සඳහා රසායනික පොහොර භාවිතය නවතා දැමීමේ ප්‍රතිපත්තියට සමගාමීව වාරියපොල පොල් පොහොර නිෂ්පාදනාගාරයේ නිෂ්පාදන කටයුතු 2021 මැයි 05 දින සිට නවතා දමා තිබුණි.<br>මෙම ව්‍යාපෘතිය සඳහා මසකට රු.25,000ක කුලියකට එළඹව ලබාගත් ඉඩමට 2018 වසරෙන් පසු බදු කුලී ගිවිසුම දීර්ඝ කරගෙන නොතිබුණු අතර 2022 මාර්තු 31න් අවසන් වර්ෂය සඳහා රු.300,000ක බදු මුදලක් ඉඩම් හිමිකරුට ගෙවීමට තිබුණි. ඉඩමේ හිමිකරු 2022 සැප්තැම්බර් 22 දින පොස්පේට් සමාගමට මෙම භූමියට ඇතුලත් වීම වළක්වා තිබූ අතර මෙම ස්ථානයේ නිෂ්පාදන කටයුතු කරගෙන යාමට අවශ්‍ය වටපිටාව 2022 ඔක්තෝබර් 25 දින වන විටත් හිමිකරු සමඟ සාකච්ඡා කර නිරවුල් කරගෙන නොතිබුණි. මෙම ස්ථානයෙන් පොල් පොහොර ව්‍යාපෘතිය ඉවත් කර ගැනීමට සිදු වුවහොත් සමාගම විසින් මෙම ඉඩමේ රු.මිලියන 17.5ක් වැයකර ඉදිකරන ලද ගොඩනැගිල්ල හා රු.150,000ක් වටිනාකම ඇති පොල් පොහොර මිශ්‍රණ යන්ත්‍රයේ පිරිවැයද සමාගමට අහිමි වීමේ ප්‍රවණතාවක් පවතී. | වෙළඳ පොල තුළ යූරියා හා එම් ඕ පී නොමැති වීම නිසා 2021 අප්‍රේල් මස සිට මෙහි පොහොර මිශ්‍රණ කටයුතු අතිහිටුවා ඇත. මෙහි පැවති ස්ථාවර වත්කම් සහ අනෙකුත් ද්‍රව්‍ය එප්පාවල ව්‍යාපෘතිය වෙත භාර දීමට කටයුතු කොට ඇත. මෙම භූමිය තුළ ඉදි කොට ඇති රු.මිලියන 17.5 ක් වටිනා ගොඩනැගිල්ල ඉවත් කර ගැනීම සම්බන්ධායෙන් ඉඩම් හිමි සමඟ සාකච්ඡා කරමින් පවතින අතර එකඟතාවයටකට පැමිණිය නොහැකි වුවහොත් නීත්‍යානුකූල ක්‍රියාමාර්ග හරහා එම ගොඩනැගිල්ල ඉවත් කර ගැනීම හෝ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සාකච්ඡා කර අයාතනයට වාසි සහගත වන ක්‍රියාමාර්ගයක් ගැනීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත. | දිගුකාලීන බදු ගිවිසුමකට එළඹ ව්‍යාපෘතිය ක්‍රියාකාරී හා ඵලදායී මට්ටමට ගෙන ඒමට ක්‍රමවේද සකස් කිරීම හෝ ආයතනයට වාසි සහගත තීරණයන්ට එළඹීමට කටයුතු කළ යුතුය. |

## 3. 3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සිංගල් සුපර් පොස්පේට් නිෂ්පාදනය සඳහා 2007 ජනවාරි 29 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණි. එප්පාවල නිධියේ ඇපටයිට් භාවිතා කරමින් ආනයනය කරනු ලබන ත්‍රිත්ව සුපර් පොස්පේට් පොහොරවලට ආදේශකයක් ලෙස නැනෝ තාක්ෂණය යොදාගෙන සිංගල් සුපර් පොස්පේට් නිෂ්පාදනය කිරීම සඳහා 2018 සැප්තැම්බර් 18 දිනැති අංක 18/2146/820/025 –I දරන ලිපියෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය නැවතත් ලබා දී තිබුණි. සිංගල් සුපර් පොස්පේට් නිෂ්පාදනය කිරීම සඳහා සල්ෆර් නම් ආනයනික පොහොරක් මිශ්‍ර කළ යුතු අතර, 2021 වර්ෂයේ දී ආනයනික පොහොර ගෙන්වීම වැළැක්වීමේ රාජ්‍ය ප්‍රතිපත්ති මත නැවතත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම කල්දැමීමට හේතු වී තිබුණි. අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබා තිබුණ ද, මෙම ව්‍යාපෘතිය මෙතෙක් ආරම්භ කර නොතිබුණි. එසේ වුවද 2020 හා 2021 වර්ෂයේ දී පොස්පේට් සමාගම මේ සඳහා රු.1,993,343ක් වියදම් කර තිබුණු අතර, ඉන් සියයට 84කට ආසන්න ප්‍රමාණයක් එනම් රු.1,673,984ක් වියදම් කර තිබුණේ ව්‍යාපෘති උපදේශක කමිටු වලට නව සම්බන්ධීකාරක ගෙවීම් සඳහා ය. මේ වන විට ආනයනික පොහොර ගෙන්වීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය වෙනස් වී තිබුණ ද, මෙම ව්‍යාපෘතියේ වැඩ කටයුතු ව්‍යාපෘතිය අනුමත කර වසර 15ක් ඉක්ම ගොස් තිබුණ ද, මේ වන තෙක් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට අදාල කටයුතු අතරමැද අත්හිටුවීම අපගේ පාලනයෙන් බැහැර ක්‍රියාකාරකම් හා ප්‍රතිපත්තිමය තීරණ මත සිදුවී ඇත. කෙසේ වෙතත් නැවතත් කඩිනමින් සිංගල් සුපර් පොස්පේට් (Single Super Phosphate – SSP) දේශීය වශයෙන් නිපදවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා ආරම්භ වී ඇත. මෙවර හෝ එම කටයුතු සාර්ථක වනවා දැකීම අපගේ ද අභිලාශය වේ. | මෙම ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කිරීමට කටයුතු කල යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදිකරමින් පැවති මෙම TGM 160 මිල් යන්ත්‍රය සඳහා Conveyor Belt අඩි 80 (18”-05ply)ක් රු.172,800ක් වැයකර සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු අතර, ස්ථානීය පරීක්ෂාවේදී එය පළුදු සහිත ස්ථාන පුරවා නැවත සකස් කර ඇති බවත් ඉරිතැලී පළුදු තිබීම හේතුවෙන් ඉදිකරමින් පවතින නව යන්ත්‍රයට සවි කිරීමට සුදුසු නොවීම නිසා එය ගබඩාවේ රඳවා පවතින බවත් දක්නට ලැබුණි. ඒ වෙනුවට ගබඩාවේ දැනට පවතින 2017 වර්ෂයේ දී මිලදී ගන්නා ලද (20*12mm) Conveyor Belt අඩි 154න් 62ක් මේ සඳහා යොදාගන තිබුණි. ගබඩාවේ හොඳ තත්ත්වයේ Conveyor Belt අඩි 154 ක් තිබියදී මෙසේ | ආයතනයේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු වරුන් තිදෙනක් සහ තවත් නිළධාරින් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් මේ සම්බන්ධයෙන් මේ වන විට පරික්ෂණයක් පවත්වමින් සිටි. | මෙම මිලදී ගැනීමට කටයුතු කර ඇති නිලධාරින්ට එරෙහිව ක්‍රියාකළ යුතුය. |

රු.172,800ක නිශ්කාර්ය වැයක් දරා තවත් Conveyor Belt අඩි 80ක් මිලදී ගැනීම හා ගන්නා ලද අයිතම භාවිතයට නුසුදුසුවීම විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය.

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ඉහල යන පොහොර ඉල්ලුමට ප්‍රමාණවත් පරිදි පොහොර සැපයීමට හා පොහොර ආනයන වියදම අඩුකිරීම යන කරුණු පදනම් කර ගනිමින් රු.34,654,178 කට නව යන්ත්‍රයක් ලෙස පාවිච්චි කරන ලද ක්‍රෂර් යන්ත්‍ර 02ක් 2014 වර්ෂයේ මිලදී ගෙන තිබූ බව හා එම යන්ත්‍රයන්හි කිසිම කොටසක එහි වර්ගය, මාදිලිය, නිෂ්පාදන සමාගම හෝ නිෂ්පාදිත රට පිළිබඳව තොරතුරු අඩංගු නොවන බව එවකට සිටි නිෂ්පාදන කළමණාකරු විසින් ඡායා රූපමය සාක්ෂි සහිතව හා ලිඛිතව සාමාන්‍යාධිකාරිට දැනුම් දී තිබුණි. මෙම යන්ත්‍ර ස්ථාපිත දින සිට 2022 සැප්තැම්බර් 30 දින දක්වා කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. තවද මිලදී ගැනීමේදී නව ක්‍රෂර් යන්ත්‍ර වෙනුවට පාවිච්චි කරන ලද යන්ත්‍ර මිලදී ගැනීමෙන් පොස්පේට් සමාගමට වූ අලාභය, එදින සිට භාවිතයට නොගැනීම වෙනුවෙන් වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට හා අලාභයන් අයකර ගැනීමට සමාගමේ බලධාරීන් මෙතෙක් කටයුතු කර නොතිබුණි.<br>එසේම මෙම යන්ත්‍රය 2014 වර්ෂයේ සිට අනාරක්ෂිතව තැබීම නිසා මේ වන විට යන්ත්‍රය විනාශ වී තිබුණු අතර මෙම යන්ත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් යන්ත්‍රය මිලදීගත් සමාගම වෙත ගෙවිය යුතු රු.4,386,358ක් වූ රඳවාගැනීම් මුදලද නිදහස් කර නොතිබුණි. | මේ සඳහා ආයතනයේ ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති අතර ඒ නිර්දේශ මත කටයුතු කරනු ලැබේ. | රු. මිලියන 34 කට වැඩි මුදලක් වැයකර මිලදීගෙන ඇති යන්ත්‍රය ඵලදායී ලෙස නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. |
| (ආ) | පිරිවැය රු.3,670,000 ක් වූ යතුරු පැදි 2ක්, වීල්ලෝඩරයක් සහ පිරිවැය රු.2,200,000 ක් වූ ඩබල් කැබ් රථයක් දීර්ඝ කාලයක සිට ධාවනයෙන් ඉවත් කර 2022 සැප්තැම්බර් 30 දින වන විටත් සමාගම් පරිශ්‍රය තුල නිෂ්කාර්යව රඳවා තිබුණි. | මෙම වාහන වෙන්දේසි කිරීම සඳහා සියළු කටයුතු මේ වන විටත් සිදු කර ඇත. | ඉවත් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියමර්ගයක් ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.6 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ අනුමත කාර්ය මණ්ඩලයට අදාලව ද්වීතියික මට්ටමේ තනතුරු 8ක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 13ක් සඳහා පිළිවෙලින් පුරප්පාඩු 9ක් හා 38ක් පැවති අතර, කම්කරු තනතුරු සඳහා එක් සේවකයෙකු හා නිෂ්පාදන සහායක තනතුර සඳහා දෛනික පදනම මත සේවය කල සේවකයින් 37 දෙනෙකු අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා බඳවාගෙන තිබුණි. | මෙම තනතුරු ස්ථිර කිරීමට කටයුතු කර නොමැති අතර විටින් විට ඇතිවන හදිසි අවශ්‍යතා මත ඒ ඒ තනතුරට අදාල කාර්යයන් කර ගෙන යාම සඳහා දෛනික ගෙවීම් පදනම මත පුද්ගලයින්ගේ සේවාව ලබා ගෙන ඇත. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු අතර අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා පත්වීම් ලබාදීමට කටයුතු නොකළ යුතුය. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාගමේ ක්‍රියාකාරී සැලැස්මට අදාල ප්‍රගතිය පරික්ෂාවේදී ක්‍රියාකාරකම් 20 කින් 07 ක් සිදුකර නොතිබුණු අතර ක්‍රියාකාරකම් 06 ක ප්‍රගතිය සියයට 1ක සිට සියයට 35 ක් අතර පරාසයක් ගෙන තිබුණි. | ක්‍රියාකාරකම් 07 ක් සිදුකර නොතිබුණු අතර 06 ක ප්‍රගතිය අඩු මට්ටමක් ගෙන තිබුණි. | සැලැස්මට අනුව කාර්යයන් ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 4.2 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම රු.916,499,400ක් වුවද, තත්‍ය ආදායම රු.741,553,282 ක් වීම හේතුවෙන් අයවැයගත ආදායමට වඩා රු.174,946,120ක් අඩුවෙන් තත්‍ය ආදායම ලැබී තිබුණි. මෙයට ප්‍රධාන හේතුව වී තිබුණේ HERP පොහොර අයවැයගත ආදායමට වඩා තත්‍ය ආදායම රු.26,444,781 කින් අඩුවීම හා පොහොර මිශ්‍රණවලින් අපේක්ෂා කළ ආදායම රු.152,242,825කින් අඩු වීමයි. | සත්‍ය අලෙවිය අඩුවීමට හේතු වී ඇත්තේ HERP අලෙවිය අඩුවීම හා පොහොර මිශ්‍රණවලින් අපේක්ෂා කළ ආදායම රු. මි. 152 කින් (සියයට16.6) අඩු වීම බව පෙන්වා දිය හැක. | අයවැයගත ආදායම තුල ආදායම පවත්වා ගැනීමට කටයුතු කල යුතුය. |